# සෝෂාව උත්තුංග වී අධිකරණය සාංඝික වීම

- ගාමිණී වියන්ගොඩ (රාවය)

සංඝයා වහන්සේලා පිරිසක් පසු ගිය දා ශ්‍රේෂ්ඨාධිකරණයට වැඩම කළ හ. ඒ, තවත් භික්ෂුවක් අත්අඩංගුවට පත් ව තිබීම කෙරෙහි සිය විරෝධය පළ කිරීම පිණිස ය.

විනිශ්වයකාරවරු විනිශ්වයාසනය වෙත ආ හ. එහෙත් අධිකරණ ශාලාවේ අසුන් ගෙන සිටි සංඝ රත්නය හුනස්නෙන් නැගිට්ටේ නැත. මේ ගැන සිය අප්‍රසාදය පළ කළ අධිකරණය, අත්අඩංගුවේ සිටි බෞද්ධ හිමියන්ට ඇප දීම සඳහා ඉදිරිපත් කර තිබූ මෝසමත් නිෂ්ප්‍රභා කෙළේ ය.

විනිශ්වයකරුවන් අධිකරණ ශාලාවට පැමිණීමේ දී සහ පිටවීමේ දී සෙස්සන් නැගිට සිටීම ලෝකාචාරය යි. එය ලිඛිත නීතියක් නො වුවත්, අධිකරණය විසින් ආරක්ෂා කෙරෙන නීතියේ සහ යුක්තියේ උත්තුංග භාවයට දක්වන ප්‍රණාමයක් වන්නේ ය. එ බැවින්, හුදෙක් සැහැල්ලු අභිචාර විධියක් වශයෙන් පමණක් එය දැකීම සාධාරණ නැත.

නීතිය ඉදිරියේ සියලු පුරවැසියන් එක සමාන ය යන්නෙන් අදහස් වන්නේ, ලිඛිත නීතිය ඉදිරියේ පමණක් නො ව, ඒ ලිඛිත නීතිය ක්‍රියාවේ යෙදවෙන සියළු අලිඛිත පැනවීම් සහ සම්මුතීන් ඉදිරියේ ද සියළු පුරවැසියන් එක සමාන විය යුතු බව යි. උදාහරණයක් වශයෙන්, කිසි යම් අපරාධයක චූදිත භික්ෂූන් වහන්සේ නමක් විත්ති කූඩුවට නැංවීම වෙනුවට අධිකරණ ශාලාවේ වෙන ම අසුන් පනවා නඩු විභාග කිරීමක් සිදු විය යුතු නැත. බෞද්ධ භික්ෂූන් වහන්සේ නමකට යම් හෙයකින් ඒ වරප්‍රසාදය පිරිනැමෙන්නේ නම්, කිතුණු, කතෝලික, මුස්ලිම් හෝ හින්දු පූජකවරයෙකුට ද ඒ අයිතිය අහිමි වන්නේ කෙ සේ දැ යි සමානාත්මතා නීතිය විසින් ම පෙන්වා දිය යුතු ව තිබේ.

ඉහත සඳහන් නඩුවේ විත්තිකාර හිමි නම චෝදනා ලැබ තිබුණේ, ශබ්ද දූෂණය පිළිබඳ නීතිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙනි. එහෙත් උන්වහන්සේ ව රක්ෂිත බන්ධනාගාරගත කර තිබුණේ, එම වරද වෙනුවෙන් නො ව, ඊට අදාළ නඩුව විභාග වන දිනයේ අධිකරණයේ පෙනී නො සිටීමෙන් අධිකරණයට අපහාස කෙළේ ය යන චෝදනාව මත ය.

දැන් මතු වන ප්‍රශ්නය වන්නේ, විනිශ්චයකාරවරු අධිකරණයට පිවිසෙද්දී. අසුන්වලින් නැගී නො සිටි ඉහත කී භික්ෂූන් වහන්සේලා අධිකරණයට අපහාසයක් නො කෙළේ ද යන්න යි. උන්වහන්සේලා ගේ හැසිරීම පදනම් කරගෙන, රක්ෂිත බන්ධනාගාරයේ සිටි භික්ෂූන් වහන්සේ වෙනුවෙන් ඉදිරිපත් කර තිබූ මෝසම අධිකරණය විසින් ප්‍රතික්ෂේප කිරීම තුළින් පෙනී යන්නේ, එම හැසිරීම අපහාසයක් වශයෙන් අධිකරණය සැළකූ බව යි. එ සේ නම්, ඔවුන් වෙනුවෙන් අධිකරණය ගත් ක්‍රියා මාර්ගය කවරේ ද? එක් භික්ෂුවක් (දිනය වැරදීමෙන්) අධිකරණයට නො පැමිණීම නිසා රක්ෂිත බන්ධනාගාරගත කෙරුණේ නම්, තවත් භික්ෂු පිරිසක් දැනුවත් ව ම අධිකරණ සම්ප්‍රදායට නිගරු කිරීම සම්බන්ධයෙන් කිසි දඬුවමකට භාජනය නො කෙරුණේ ඇයි? ඒ මදිවාට, ඔවුන් කළ වරදට, ඊට කිසි සම්බන්ධයක් නැති රක්ෂිත බන්ධනාගාර ගත ව සිටි භික්ෂූන් වහන්සේ ගේ මෝසම ප්‍රතික්ෂේප කිරීම තුළින් අධිකරණය උන්වහන්සේ ගෙන් පළිගත්තේ කුමන නීතියක් යටතේ ද?

රටේ නීතිය ක්‍රියාත්මක කිරීම එක්තරා අදියරකින් පසු ආගමික අධිකාරීවාදයක බලපෑමට යටත් වන විට අධිකරණයට තව දුරටත් ස්වාධීන ව ක්‍රියා කිරීමේ ඉඩකඩ ඇහිරෙන බව මෙයින් පෙනී යයි. පසු ව දා එම හිමි නම, අධිකරණයට අපහාස කිරීමේ වරදින් පමණක් නො ව, ශබ්ද දූෂණ නීතිය කඩ කිරීමේ වරදින් ද නිදහස් කරනු ලැබීමෙන් මේ බව තවත් සනාථ වෙයි.

එ පමණක් ද? නැත, රටේ රාජ්‍ය නායකයා ද උන්වහන්සේ ව රජ ගෙදරට කැන්දා හරසරින් පිළිගත්තේ ය.

මේ හිමියන් වැඩ වසන්නේ අනවසර ඉඩමක නීති විරෝධී ව තනා ගත් ආරාමයක බව පසු ව හෙළි විය. දැන්, ජනාධිපතිවරයා ගේ හරසර මැද භික්ෂු තුමෝ ඊට ද පිළියමක් පැතූ හ. ආරක්ෂාව පතා ඉන්දියානු කෝවිල් ගානේ ගියත්, රාෂ්ට්‍ර පාලනයේ දී පිවිතුරු බෞද්ධයෙකු වන ජනාධිපතිතුමා, අදාළ ඇමතිතුමා කැඳවා එම අනවසර ඉඩමේ ''න'' යන අකුර ඉවත් කරන ලෙසට උපදෙස් දුන්නේ ය. (ඒ 'දේශපාලනය' ගැන වෙන ම කතා කළ යුතු ය).

මේ හිමියන් ව රක්ෂිත බන්ධනාගාරගත කිරීමට එරෙහි ව පැන නැගුණු විරෝධය කෙරෙහි සිවුරක පූජණීයත්වය මෙ තරම් වැඩ කොටසක් ඉටු කෙළේ අදාළ වරද පිළිබඳ පැවති තවත් අගතියක් නිසාවෙනි. එ නම්,

ශබ්ද දූෂණය පිළිබඳ සංකල්පය ම අපේ රටට අදාළත්වයක් නැති කුණුහරුපයක් වශයෙන් බොහෝ දෙනා සළකන නිසාවෙනි. රාත්‍රී සංගීත සංදර්ශනවලින් මුදල් හරිහම්බ කරන එක් ගායකයෙක් මේ නීතියට තමන් විරුද්ධ බව මා සමග කී ය. බුද්ධාගමේ 'ශබ්ද පූජාවට' මේ නීතිය මගින් අවමන් කෙරෙති යි එක් හිමි නමක් කී ය. තමන් ගේ ආගමික වෘතයක් මැඩලීම සඳහා මේ නීතිය පනවා ඇතැ යි මුස්ලිම් බැතිමතෙක් කී ය. මේ සියල්ලන්ට ම 'ඝෝෂාව' අවශ්‍ය කර තිබේ.

අප වනාහී ඝෝෂාකාරී සමාජයකි. ''සක්කිලි පඩි ගත්තා වගේ'' යැයි, (එක් පීඩිත ජාතියක් අවමානයට පත් කරමින්) කතාවට කියන අපි කවුරුත්, සැබවින් ම ''සක්කිලි'' ය. වාහන නලා හැ'ඩවෙන ආකාරය සැළකිල්ලට ගත්න. බොහෝ විට මේ නලා හැ'ඩවෙන්නේ අනිකා බිය වැද්දීමට ය. අනිකා යටපත් කිරීමටය. අපේ වාහනයක තිරිංගවලට (හික්මීමට) වඩා වැදගත් වන්නේ, නලා (ශබ්ද බිය) ය. උසාවි, පාසල් සහ රෝහල් අසළ නලා හැ'ඩවීම තහනම් කෙරෙමින් සිටුවා ඇති සංඥා පුවරු සෑම නගරයක ම අඩු වශයෙන් සෑම මීටර් සීයක් පාසා ම සිටුවිය යුතු යැයි යෝජනා කිරීමට කාලය පැමිණ ඇතැ යි සිතමි. ඊට පෙරහුරුවක් වශයෙන්, මෙ රටට ගෙන්වන සෑම වාහනයක ම නලා, වරායේ දී ම ගලවා දැමීමත් නරක නැත.

අප කුඩා කල ගමකට තිබුණේ එක රේඩියෝවක් හෝ දෙකකි. ඒ බැවින් එම රේඩියෝව ගමට ඇසෙන්නට ක්‍රියාත්විත කැරැවීම එක්තරා ආකාරයකින් ඒ දා ගමට කළ අනුග්‍රහයක් විය. අද සෑම ගෙයක ම පාහේ එක්කෝ රේඩියෝවක් හෝ රූපවාහිනියක් තිබේ. ඒ සේ තිබිය දී, අල්ලපු ගෙදර රේඩියෝව හෝ රූපවාහිනිය මගේ අනුමැතියෙන් තොර ව මට ඇසෙන්නට සැලැස්වීම මා කෙරෙහි අනවශ්‍ය බලහත්කාරය පෑමක් ම වන්නේ ය.

කුප්‍රකට ඇමරිකානු ගුවන්තනමෝ සිර කඳවුරේ සිටි එක් මුස්ලිම් සිරකරුවෙක් මෙ සේ කියයිඃ ''සෑම උදේක ම අපට යාච්ඤා කිරීමට අවසර දුන්නේ ය. එහෙත් අප යාච්ඤා කරන අතරේ ඔවුහු (බන්ධනාගාර නිලධාරීන්) මහත් හ'ඩින් සංගීතය වාදනය කළ හ. විටෙක, එය රොක් සංගීතය යි. විටෙක, ඇමරිකානු ජාතික ගීය යි.''

යුරෝපයේ මහල් නිවාසයක උපන් දින සාදයක් වැනි උත්සව අවස්ථාවක් තිබේ නම් ඒ ගැන කල් තියා එම මහල් නිවසේ සෙසු

නිවැසියන් දැනුවත් කළ යුතු ය. ඇති විය හැකි කරදරය ගැන සමාව ඉල්ලා ගොඩනැගිල්ලේ යම් තැනක කෙටි දැන්වීමක් ඇලවිය යුතු ය.

මේවා අපේ සංස්කෘතියට, අපේ ආගමට නො ගැළපෙන චර්යාවන් නම් කළ යුතු ව ඇත්තේ, ඒ සංස්කෘතින් සහ ආගම් මේ ශිෂ්ට චර්යාවන්ට අනුගත වන පරිදි යාවත්කාලීන කිරීම යි. සෑම සංස්කෘතියක් ම, සෑම ආගමක් ම අද වන තෙක් පැමිණ ඇත්තේ එ වැනි හැඩගැසීම් හරහා ය. එ සේ හැඩගැසීම ප්‍රතික්ෂේප කළ ආගම් සහ සංස්කෘති නතර වී ඇත්තේ කෞතුකාගාර තුළ ය.